# පිවිතුරු හෙළ උරුමය

## පක්ෂ ව්‍යවස්ථාව

1. පක්ෂයේ නම

පක්ෂයේ නම "පිවිතුරු හෙළ උරුමය" වන්නේය.

2. පක්ෂයේ ඡන්ද ලකුණ

පක්ෂයේ සංකේතය පළමු උපලේඛණයෙන් නිරූපිත "මල" වන්නේය.

3. පක්ෂයේ දැක්ම

ශ්‍රී ලංකාව ධර්ම රාජ්‍යයක් බවට පත් කිරීම.

4. පක්ෂයේ මෙහෙවර

රාජ්‍යයේ මෙන්ම ජනතාවගේ ගැටළු සඳහා විසඳුම් බෞද්ධ දර්ශනය පදනම් කරගෙන ඉදිරිපත් කිරීම.

5. පක්ෂයේ ප්‍රතිපත්ති

   1. ශ්‍රී ලංකා රාජ්‍යය ගොඩ නැගීම බෞද්ධ දර්ශනයට අනුකූලව සිදුවිය යුතුය. බුද්ධ ශාසනය සුරක්ෂිත කර පෝෂණය කිරීම රාජ්‍යයේ වගකීමක් වන්නේය. සදාචාර විරෝධි අයුරින් යම් ආගමකට හරවා ගැනීම නීති විරෝධි කළ යුතුය.
   2. ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් වන්නේය.
   3. ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව තර්ජනයට ලක්වන ඕනෑම අවස්ථාවක එකී තර්ජනය ඇති කරන බලවේග විනාශ කිරීමට සමස්ත ජාතියම සියළු භේද පසෙක ලා සමගිව කටයුතු කළ යුතු වන්නේය.
   4. සිංහල ශිෂ්ටාචාරයේ නිජබිම ශ්‍රී ලංකාව බැවින් ශ්‍රී ලංකාවේ ජාතික අයිතිය ඇත්තේ සිංහල ජාතියටයි.
   5. ධර්මාශෝක අධිරාජ්‍යයා විසින් බෞද්ධ දර්ශනය පදනම් කරගෙන ගොඩ නැගූ ධර්ම රාජ්‍යය සංකල්පයට අනුව සියළු රටවැසියන් මගේ දරුවන්ය (සවෙ මුනිසෙ මම පජා) යන ස්ථාවරයෙහි පිහිටා සියළු ජන කොටස් සම්බන්ධයෙන් කටයුතු කිරීම පාලකයින්ගේ වගකීම වේ.
   6. ග්‍රාම රාජ්‍ය සංකල්පය පදනම් කර ගනිමින් බලය හැකි තාක් දුරට ජනතාවට සමීප ආයතනයන්ට ලබාදිය යුතු අතර නිදහස් ජන අදහසට අවකාශ සලසන ජනසම්මමතවාදි දශරාජ ධර්මය පදනම් කරගත් රාජ්‍ය පාලනයක් පවත්වාගෙන යා යුතුය.
   7. මහ කරුණා සංකල්පය පදනම් කරගෙන මිනිසුන්, ගස්වැල්, සතුන් ඇතුළු වත්මන් මෙන්ම අනාගත ජීවින් ද අජීවි සොබා දහම ද ඒකාත්මික කරගත් තිරසර සංවර්ධන රටාවක් ඇති කළ යුතුය. නගරික සංවර්ධනය, ප්‍රවාහනය, බලශක්ති වැනි ක්ෂේත්‍රයන්හි පරිසර හිතකාමී විසඳුම් හඳුන්වා දී සොබා සම්පත් සහ ජෛව විවිධත්වය සුරැකීමට ආණ්ඩුව උත්සුක විය යුතුය.
   8. මෙත්තා, කරුණා, මුදිතා සහ උපෙක්ඛා යන සතර බ්‍රහ්ම විවරණ අනුව දිවි ගෙවන ජාතියක් බිහි කිරීමට ආණ්ඩුව උත්සුක විය යුතුය.
   9. තණ්හාව වෙනුවට සියළු ජනයාගේ අවශ්‍යතා ඉටු කරන ධාර්මික ජාතික ආර්ථිකයක් ගොඩ නැංවිය යුතුය. දේශීය දැනුම, ජනතාව සහ සම්පත් පදනම් කරගත් ව්‍යාපාරයන්ට ප්‍රමුඛතාව ලබාදිය යුතුය.
   10. ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය සුරක්ෂිත කර පෝෂණය කිරීම රාජ්‍යයේ වගකීමක් වන්නේය.

11. ආර්ථික සංවර්ධනය ළඟා කර ගත යුත්තේ අධ්‍යාත්මික සංවර්ධනයට සහ සදාචාරයට බාධාවක් නොවන අයුරිනි.

12. ධර්ම සංගායනාවක් පවත්වා සිංහල භික්ෂු වංශය නැවත සක්‍රියව ස්ථාපිත කළ යුතු අතර ශ්‍රී ලංකා රාජ්‍යය තුල භික්ෂුවගේ උපදේශන සහ අධ්‍යාත්මික කාර්යභාරය ස්ථාපිත කළ යුතුය.

13. අතීතයේ අප රට ලොව පුරා බුදු දහම පැතිරූ ධර්මද්වීපය විය. එබැවින් සහෝදර බෞද්ධ රටවල් සම්බන්ධ කර ගනිමින් බෞද්ධ රටවල ජාත්‍යන්තර එකමුතුවක් ගොඩ නැංවිය යුතුය. එමෙන්ම අසල්වැසි රටවල් සමග මිත්‍රත්වය ඉහළ නංවන දේශයේ නිවහල් බව සුරකින සමානාත්මතාව මත පදනම් වූ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය.

14. වාණිජත්වයට හා දූෂිරිතට ගොදුරු වී බෙදී ගිය සමාජයක් වෙනුවට ගිහි-පැවිදි, ගුරු-ගෝල, අඹු-සැමි, මාපිය-දූදරු, පාලක-පාලිත, සේව්‍ය-සේවක සහ ව්‍යාපාරික-පාරිභෝගික ආදි සමාජ සබඳතා සුචරිතය මත එක්තැන් කළ අන්‍යෝන්‍ය යුතුකමින් බැඳී ගිය ධාර්මික සමාජයක් ඇති කළ යුතුය.

15. ශ්‍රී ලංකාවේ සංස්කෘතියටත් නවලොව අවශ්‍යතාවයන්ටත් ගැලපෙන ආකාරයේ අධ්‍යාපන ක්‍රමයක් සැකසිය යුතුය. දේශීය දැනුම නවලොව සමග ගලපා ප්‍රචලිත කළ යුතුය.

16. වාණිජත්වයට, විජාතික සංස්කෘතින්ට මෙන්ම විජාතික අවශ්‍යතාවයන්ට යට නොවුණු නිදහස් මාධ්‍ය ප්‍රතිපත්තියක් පවත්වාගත යුතුය.

6. නිර්වචන සහ පැහැදිලි කිරීම්

6.1. "පක්ෂය" යනු පිවිතුරු හෙළ උරුමයයි.

6.2. යම් සභාවක "සරල බහුතරය" යනු එකී සභාවේ ඡන්ද විමසන අවස්ථාවේ සිටි සාමාජිකයින්ගෙන් 50%ක් ඉක්මවන පිරිසයි.

6.3. යම් සභාවක "පූර්ණ සරල බහුතරය" යනු එකී සභාවේ නොපැමිණි අය ද ඇතුළු සියළුම සාමාජිකයින්ගෙන් 50%ක් ඉක්මවන පිරිසයි.

6.4. යම් සභාවක "විශේෂ බහුතරය" යනු එකී සභාවේ නොපැමිණි අය ද ඇතුළු සියළුම සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකක් වන හෝ එය ඉක්මවන පිරිසයි.

6.5. යම් සභාවක "ගණ පූරණය" යනු නිළධාරින් දෙදෙනෙකු ද ඇතුළු එකී සභාවේ සාමාජිකයින්ගෙන් තුනෙන් එකක (1/3) සාමාජික සංඛ්‍යාවයි.

6.6. "සක්‍රිය දිසා සභාවක්" යනු සළකා බලන දින සිට මාස පහලොවක් ඇතුලත නව නිළධාරි මණ්ඩලයක් පත්කර ඒ බව ජාතික සංවිධායකට දැනුම් දී ඇති දිසා සභාවකි.

6.7. "රාජ්‍ය ආයතනයක දේශපාලන තනතුරක්" යනු ආණ්ඩුවක ජනාධිපති, අගමැති, ඇමති, නියෝජ්‍ය ඇමති, ආණ්ඩුවේ විශේෂ නියෝජිත හෝ පාර්ලිමේන්තුවක කතානායක, සභානායක, විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක හෝ ශ්‍රී ලංකා විදේශ සේවයට සම්බන්ධ නොවී තානාපති සේවයේ දරණ ඕනෑම තනතුරක් හෝ පලාත් ආණ්ඩුවක ආණ්ඩුකාර, ප්‍රධාන ඇමති, ඇමති හෝ පලාත් සභාවක සභාපති, නියෝජ්‍ය සභාපති, සභානායක, විපක්ෂ නායක හෝ පලාත්පාලන ආයතනයක නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, නියෝජ්‍ය සභාපති හෝ රාජ්‍ය ආයතනයක රජය නියෝජනය කරන අධ්‍යක්ෂවරයෙකු හෝ උපදේශකයෙකු හෝ ඇමතිවරයෙකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයක තනතුරක් ඊට සමාන හෝ අනුරූපී ඕනෑම තනතුරකි. යම් රජයේ සේවකයෙකු තමන් දරණ තනතුර මත තානාපති සේවයේ තනතුරක් හෝ රාජ්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයෙකු හෝ උපදේශකයෙකු හෝ ඊට සමාන හෝ අනුරූපී ඕනෑම තනතුරකට පත්වීම මෙම නිර්වචනය තුලට නොවැටේ.

6.8. "මහජන නියෝජිත මණ්ඩලයක්" යනු පාර්ලිමේන්තුව, පලාත් සභාව, නගර සභාව, ප්‍රාදේශීය සභාව වැනි මහජනතාව විසින් පත් කරන නියෝජිතයින් බහුතරයකින් සැදුම්ලත් ආයතනයකි.

6.9. "මහජන නියෝජිත" යනු මහජනතාවගේ ඡන්දයෙන් තේරී පත්වී හෝ වෙනත් බලධාරියෙකු විසින් පත්කිරීමක් කර හෝ මහජන නියෝජිත මණ්ඩලයක සාමාජිකත්වය දරණ අයෙකි.

6.10. "යාවජීව සාමාජිකයා" යනු වාර්ෂිකව සාමාජිකත්වය අළුත් කරනු වෙනුවට සිය ජීවිත කාලය පුරාවට පක්ෂ සාමාජිකත්වය එක්වර ලබා ගන්නා අයෙකි. නමුත් විනය හේතු මත යාවජීව සාමාජිකයින් ද ඉවත් කළ හැක.

6.11. "ප්‍රධාන නිලධාරියෙකු" යනු නායක, නියෝජ්‍ය නායක, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික සහ උප සභාපති යන තනතුරුය.

6.12. යම් යෝජනාවක් අනුමත වීමට අවශ්‍ය බහුතරය පිළිබඳ විශේෂ සඳහනක් නොමැති නම් එකී යෝජනාව සම්මත වීම සඳහා අවශ්‍ය වන්නේ සභාවේ සරල බහුතරයයි.

6.13. ඔහු යනුවෙන් සඳහන් තැන් හි අවස්ථානුකූලව ඇය ද ඇය යනුවෙන් සඳහන් තැන් හි අවස්ථානුකූලව ඔහු ද අදහස් වේ.

7. පක්ෂ සාමාජිකත්වය

7.1. පක්ෂයේ හෝ පක්ෂය නියෝජනය කරන තනතුරක් දැරීම සඳහා පක්ෂ සාමාජිකත්වය දැරීම අනිවාර්රය වේ.

7.2. මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන මුදලක් වාර්ෂික සාමාජික ගාස්තු ලෙස අය කරනු ලැබිය හැක. එකී මුදල සාමාජික අයදුම්පතේ සඳහන් කළ යුතුය.

7.3. පක්ෂ සාමාජිකත්වය ලබා ගැනීම.

7.3.1. වයස අවුරුදු දහඅට (18) සම්පූර්ණ කළ පක්ෂයේ ප්‍රතිපත්ති පිළිගන්නා ඕනෑම අයෙකුට පක්ෂයේ සාමාජිකත්වය සඳහා අයදුම් කළ හැක.

7.3.2. අයදුම්කරු වෙනත් පක්ෂයක සාමාජිකත්වය දරන්නේ නම් ඒ බව අයදුම්පතේ සඳහන් කළ යුතුය.

7.3.3. අයදුම්කරු පක්ෂයේ අරමුණු සහ ව්‍යවස්ථාව පිළිගන්නා බවට අයදුම්පතේ සඳහන් කර අත්සන් තැබිය යුතුය.

7.3.4. පක්ෂ සාමාජිකත්වය පතා ඉදිරිපත් කරන ඕනෑම අයදුම්පතක් හේතු දක්වා හෝ නොදක්වා ප්‍රතික්ෂේප කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

7.3.5. යම් අයෙකුට පක්ෂ සාමාජිකත්වය ලබා දුන්නේ නම් ඒ බව ඔහුට ලිඛිතව දැනුම්දිය යුතුය.

7.3.6. යම් සාමාජිකයෙක් වසර දහයක සාමාජික මුදල් එකවර ගෙවීමෙන් යාවජීව සාමාජිකත්වය ලබාගත හැක.

7.3.7. යම් අයෙක් පක්ෂ සාමාජිකත්වය ලබාගෙන නොතිබුණ ද පක්ෂයේ යම් නිළයකට තේරී පත්වී හෝ පත්වීමක් ලබා එකී තනතුර භාර ගත්තේ නම් පක්ෂ සාමාජිකත්වය ලැබුවා සේ සැළකේ. එකී තනතුර භාර ගැනීමට පෙර පක්ෂයේ නිළධාරියෙකු විසින් ඔහු ස්වයංක්‍රීයව පක්ෂ සාමාජිකයෙකු වන බව එකී තනතුරුලාභියාට දැනුම් දිය යුතුය.

7.3.8. යම් අයෙක් පක්ෂ සාමාජිකත්වය ලබාගෙන නොතිබුණ ද මැතිවරණයක් සඳහා ඉදිරිපත් කරන පක්ෂයේ නාමයෝජනා පත්‍රයේ අත්සන් තැබීම සාමාජික අයදුම්පතක් ඉදිරිපත් කළා සේ සැළකේ. එකී නාමයෝජනා පත්‍රයට පක්ෂයේ ප්‍රධාන ලේකම් අත්සන් තැබීම සාමාජිකත්වය ප්‍රදානය කළා සේ සැළකේ. සාමාජිකයෙක් නොවන අයෙක් නාමයෝජනා පත්‍රයට අත්සන් තබන්නේ නම් ඔහුට සාමාජිකත්වය ස්වයංක්‍රීයව ලැබෙන බව නාමයෝජනා පත්‍රයට අත්සන් තැබීමට පෙර පක්ෂයේ නිළධාරියෙකු විසින් ඔහුට පැහැදිලි කළ යුතුය.

7.3.9. පක්ෂය යම් දේශපාලන සංධානයක සාමාජිකත්වය දරමින් එකී සංධානය හරහා මැතිවරණයකට ඉදිරිපත් වන්නේ නම් පක්ෂයේ ලේකම් විසින් සංධානයේ ලේකම්ට ඉදිරිපත්

කරන අපේක්ෂක ලැයිස්තුවේ යම් සාමාජිකයෙකු නොවන අයෙකුගේ නම ඔහුගේ ලිඛිත ඉල්ලීම මත අඩංගු කලේ නම් ඔහුට සාමාජිකත්වය ප්‍රදානය කළා සේ සැළකේ. සාමාජිකයෙක් නොවන අයෙක් එවැනි ඉල්ලීමක් කලේ නම් ඔහුට සාමාජිකත්වය ස්වයංක්‍රීයව ලැබෙන බව පක්ෂයේ නිළධාරියෙකු විසින් ඔහුට පැහැදිලි කළ යුතුය.

7.4. මධ්‍යම කාරක සභාව විසින් පූර්ණ සරල බහුතරයකගේ අනුමැතියෙන් "ගෞරවනීය යාවජීව සාමාජිකත්ව" සමාජයේ ගෞරවනීය චරිත වෙත පිරිනැමිය හැක. එවැනි සාමාජිකයින් සාමාජික ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.

7.5. පක්ෂ සාමාජිකයෙකුගේ යුතුකම් සහ වගකීම්

7.5.1. පක්ෂ ව්‍යවස්ථාව සහ ඒ යටතේ සම්මත කරනු ලබන අනුව්‍යවස්ථා අනුගමනය කිරීම.

7.5.2. පක්ෂයේ නිළධාරීන් හෝ ආයතන ගනු ලබන තීරණ අනුව කටයුතු කිරීම.

7.5.3. පක්ෂයේ නිළධාරීන් හෝ ආයතන කරනු ලබන නියෝග පිළිපැදීම.

7.5.4. පක්ෂයේ ප්‍රතිපත්ති අගය කිරීම, සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම.

7.5.5. පක්ෂයේ ප්‍රතිරූපය ඉහළ නැංවීම.

7.5.6. පක්ෂයේ ප්‍රතිපත්ති, තීරණ, නියෝග නිලධාරීන් සහ නියෝජිතයින් ප්‍රසිද්ධියේ විවේචනය කිරීමෙන් වැළකීම.

7.5.7. යම් මැතිවරණයක දී හෝ ඡන්ද විමසීමක දී පක්ෂය විසින් නම් කරනු ලබන හෝ සහය පළ කරනු ලබන අපේක්ෂකයින්ට හෝ පක්ෂවලට හෝ කණ්ඩායම්වලට පමණක් සහය පළ කිරීම සහ ආධාර කිරීම.

7.5.8. පක්ෂයේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමක් ලෙසින් මැතිවරණයකට තරග කිරීමෙන් වැළකීම.

7.5.9. පක්ෂයේ ප්‍රතිපත්ති සහ තීන්දු සමග ගැටෙන හෝ ගැටීමට ඉඩ ඇති යම් කටයුත්තකට සහභාගිවීමෙන්, සහය පළ කිරීමෙන් හෝ ආධාර කිරීමෙන් වැළකී සිටීම.

7.5.10. පක්ෂය අපකීර්තියට පත්විය හැකි අයුරින් ක්‍රියා නොකිරීම.

7.5.11. පක්ෂ සාමාජිකයෙකුට අනුචිත අයුරින් ක්‍රියා නොකිරීම.

7.6. පක්ෂ සාමාජිකයෙකුගේ බලතල සහ අයිතිවාසිකම්

7.6.1. පක්ෂයේ නිලතල දැරීම.

7.6.2. මැතිවරණයන්හි දී පක්ෂ අපේක්ෂකයෙකු වීමට අයදුම් කිරීම.

7.6.3. පක්ෂය විසින් නියම කරන යම් ගාස්තුවක් ඇත්නම් එය ගෙවා පක්ෂ ව්‍යවස්ථාවේ හෝ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටපත් ලබා ගැනීම.

7.6.4. ව්‍යවස්ථානුකූලව පක්ෂ සම්මේලනය කැඳවන මෙන් ඉල්ලීම.

7.6.5. ව්‍යවස්ථානුකූලව පක්ෂ සම්මේලනයට සහභාගිවීම.

7.6.6. ව්‍යවස්ථානුකූලව පක්ෂ සම්මේලනයක දී යෝජනා ඉදිරිපත් කිරීම.

7.6.7. ව්‍යවස්ථානුකූලව පක්ෂ සම්මේලනයක දී ඡන්දය පාවිච්චි කිරීම.

7.6.8. පක්ෂ නායකත්වයට යෝජනා හෝ ප්‍රශ්න ඉදිරිපත් කර දින තිහක් ඇතුලත පිලිතුරක් ලබා ගැනීම.

7.7. පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම

7.7.1. සාමාජිකයෙකු කරන මතු දැක්වෙන ඕනෑම ක්‍රියාවක් හේතුවෙන් පක්ෂ සාමාජිකත්වය අහෝසි විය හැක.

7.7.1.1. පක්ෂයේ පූර්ව ලිඛිත ප්‍රකාශිත අනුමැතියකින් තොරව රාජ්‍ය ආයතනයක දේශපාලන තනතුරක් ලබා ගැනීම.

7.7.1.2. යම් සාමාජිකයෙකු වෙනත් පක්ෂයක සාමාජිකත්වයෙන් ඉවත්විය යුතු බවට මධ්‍යම කාරක සභාව විසින් තීරණය කර එකී තීරණය ප්‍රධාන ලේකම් විසින් අදාළ සාමාජිකයාට දැනුම් දී දින තිහක් ඇතුලත එකී පක්ෂයෙන් ඉවත් වී ඒ බව ප්‍රධාන ලේකම්ට ලිඛිතව දැනුම්දීමට අසමත්වීම.

7.7.2. යම් රාජ්‍ය ආයතනයක දේශපාලන තනතුරක් භාරගත් බවට ආණ්ඩුවේ නිල ලේඛණයක සටහන්වීම ඉහත 7.7.1.1 අනුව සාමාජිකත්වය අහෝසිවීමට ප්‍රමාණවත්ය.

7.7.3. යම් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වී ඇති බවට තොරතුරු ලැබුණු විට ප්‍රධාන ලේකම් විසින් ඒ බව අදාළ සාමාජිකයාට නොපමාව දැනුම් දිය යුතුය.

7.8. පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපීම

7.8.1. මතු දැක්වෙන ඕනෑම කරුණකට වැරදිකරු වන සාමාජිකයෙකු සාමාජිකත්වයෙන් නෙරපීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

7.8.1.1. පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම.

7.8.1.2. පක්ෂයේ ආයතනයක් හෝ නිළධාරියෙකු විසින් ලබාදෙන ලද නියෝගයක් නොසළකා හැරීම.

7.8.1.3. පක්ෂ සාමාජිකයෙකු දරණ රාජ්‍ය ආයතනයක දේශපාලන තනතුරකින් හෝ මහජන නියෝජිත මණ්ඩලයක මහජන නියෝජිත තනතුරකින් ඔහු ඉවත්විය යුතු බවට මධ්‍යම කාරක සභාව විසින් තීරණය කර ප්‍රධාන ලේකම් විසින් ලිඛිතව ඔහුට ඒ බව දන්වා දින දහහතරක් ඇතුලත එකී තනතුරින් ඉවත් නොවීම.

7.8.1.4. පක්ෂය අපකීර්තියට පත්විය හැකි අයුරින් ක්‍රියා කිරීම.

7.8.1.5. පක්ෂ සාමාජිකයෙකුට අනුචිත අයුරින් ක්‍රියා කිරීම.

7.8.1.6. සෑම වසරකම මාර්තු 31 දිනට පෙර එම වර්ෂය සඳහා සාමාජික ගාස්තු ගෙවීම පැහැර හැරීම.

7.8.2. යම් සාමාජිකයෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට පෙර එකී වරද පිළිබඳ අනතුරු ඇඟවීම හෝ අවවාද කිරීම අවශ්‍ය නොවේ.

7.8.3. යම් සාමාජිකයෙකු සාමාජිකත්වයෙන් නෙරපා හැරීමට පෙර ඔහුට එරෙහිව ඇති චෝදනා විමර්ශනය කර සිය නිර්දේශ ඉදිරිපත් කරන මෙන් මධ්‍යම කාරක සභාව විසින් විනය මණ්ඩලයට යොමු කළ යුතුය.

7.8.4. සාමාජිකත්වයෙන් නෙරපා හැරීමක් සිදුවිය යුත්තේ පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් අනුමත කරන ලද විනය අනුව්‍යවස්ථාව අනුවයි.

7.8.5. යම් සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන් හෝ අස් කිරීමෙන් හෝ සාමාජිකත්වය අහෝසිවීමෙන් හෝ වෙනත් ආකාරයකින් පක්ෂ සාමාජිකත්වය අහිමි වුවහොත් ඔහු විසින් පක්ෂයේ දැරූ තනතුරු ද පක්ෂ නියෝජනය කරමින් දැරූ තනතුරු ද ඉබේම අහිමි වනු ඇත. ඒ පිළිබඳව යම් ආයතනයකට, සංවිධානයකට හෝ පුද්ගලයෙකුට දැනුම්දිය යුතු නම් ප්‍රධාන ලේකම් විසින් නොපමාව එම දැනුම්දීම කළ යුතුය.

7.9. පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීම

7.9.1. යම් සාමාජිකයෙකු පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට හේතු වන ක්‍රියාවක් කර ඇති බවටත් එයින් පක්ෂයට අගතියක් සිදු වන බවටත් පක්ෂ නායක සෑහීමකට පත් වන විට එකී සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවීමට පක්ෂ නායකට හැකිය.

7.9.2. යම් සාමාජිකයෙකුගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීම මාස තුනක් ඇතුලත මධ්‍යම කාරක සභාව විසින් තහවුරු කළ යුතුය.

7.9.3. යම් සාමාජිකයෙකුගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීම පක්ෂ නායක හෝ ප්‍රධාන ලේකම් අත්සන් කළ ලිපියක් මගින් ඔහුට දැනුම් දිය යුතුය.

8. පක්ෂයේ සංයුතිය

8.1. ප්‍රධාන නිළධාරීන්
8.2. මධ්‍යම කාරක සභාව
8.3. දේශපාලන මණ්ඩලය
8.4. විනය මණ්ඩලය
8.5. ජාතික මණ්ඩලය
8.6. ජාතික සභාව
8.7. ජාතික සම්මේලනය
8.8. දිසා ජන සභා
8.9. ආසන ජන සභා
8.10. ශාඛා ජන සභා
8.11. විදේශීය ජන සභා
8.12. අනුබද්ධිත සංවිධාන

9. ප්‍රධාන නිළධාරීන්

9.1. නායක

9.1.1. පක්ෂයේ ප්‍රධානියා වේ.
9.1.2. පක්ෂ සම්මේලනය, මධ්‍යම කාරක සභාව සහ දේශපාලන මණ්ඩලය යන ආයතනයන්හි මුලසුන හෙබවීම.
9.1.3. යම් කාරණාවක් සම්බන්ධයෙන් සභාවක ඡන්ද විමසීමේ දී සභාව සමානව බෙදී ඇත්නම් තීරක ඡන්දය පාවිච්චි කිරීම.
9.1.4. පක්ෂයේ සියළුම සංවිධාන, අනුසංවිධාන සහ අනුබද්ධිත සංවිධාන මෙහෙයවීම සහ අධීක්ෂණය
9.1.5. ආසන සංවිධායකයින් පත් කිරීම.
9.1.6. මධ්‍යම කාරක සභාවේ හෝ දේශපාලන මණ්ඩලයේ තීරණයන්ට අනුව අනෙකුත් දේශපාලන පක්ෂ සමග සබඳතා පවත්වාගෙන යෑම සහ ඒ පිළිබඳ එකී සභාවන් දැනුම්වත් කිරීම.
9.1.7. පක්ෂ සම්මේලනය, උත්තරීතර මණ්ඩලය, මධ්‍යම කාරක සභාව හෝ දේශපාලන මණ්ඩලය කැඳවන මෙන් ප්‍රධාන ලේකම්වරයාට උපදෙස් දීම. එකී උපදෙස් පරිදි පක්ෂ සම්මේලනය දින හතක් ඇතුලත ද අනෙකුත් ආයතන දින දෙකක් ඇතුලත ද කැඳවීම සඳහා ලිපි යැවීමට ප්‍රධාන ලේකම්වරයා අපොහොසත් වුවහොත් එකී ආයතන කැඳවන මෙන් පරිපාලන ලේකම්වරයාට උපදෙස් දීම.
9.1.8. විනය කඩ කිරීමට චූදිත සාමාජිකයෙකු වරද පිළිගෙන සමාව අයැද යළි එම වරද නොකරන බවට දෙන ලිඛිත පොරොන්දු භාරගෙන මධ්‍යම කාරක සභාවේ සභාගත කිරීම.
9.1.9. පක්ෂ සම්මේලනයේ දී සම්මත වන යෝජනා ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම.
9.1.10. පක්ෂය වෙනුවෙන් ශුභ පැතුම් ප්‍රකාශ නිකුත් කිරීම.

9.1.11. සුවිශේෂ අවස්ථාවන්හි මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරන ලද පක්ෂයේ මතය ප්‍රසිද්ධ කිරීම.

9.2. නියෝජ්‍ය නායක

9.2.1. නියෝජ්‍ය නායකවරු ගණන දෙකකි.

9.2.2. අසනීපවීම, විදේශගත වීම හෝ වෙනත් හේතුවක් මත පක්ෂ නායකට සිය තනතුරේ කටයුතු කිරීමට නොහැකි අවස්ථාවන් හි නායක විසින් කරනු ලබන පත්වීමක් මත නායක තනතුරේ වැඩ බැලීම.

9.2.3. නායක තනතුර පුරප්පාඩුව පවතින අවස්ථාවක මධ්‍යම කාරක සභාව විසින් කරන පත්වීමක් මත නායක තනතුරේ වැඩ බැලීම.

9.2.4. එක් නියෝජ්‍ය නායකයෙකු ජාතික සභාවේ සභාපති ධූරය දැරිය යුතුය.

9.3. ප්‍රධාන ලේකම්

9.3.1. පක්ෂයේ ව්‍යවස්ථාව ද ඇතුළු සියළුම ලේඛණ සුරක්ෂිතව තබා ගැනීම.

9.3.2. මැතිවරණ කොමසාරිස්වරයා ඇතුළු සියළුම බාහිර පාර්ශව සමග ලිපි ගනුදෙනු සිදු කිරීම.

9.3.3. ව්‍යවස්ථානුකූලව දේශපාලන මණ්ඩලය, මධ්‍යම කාරක සභාව, පක්ෂ සම්මේලනය සහ උත්තරීතර උපදේශක මණ්ඩලය කැඳවීම.

9.3.4. පක්ෂයේ වාර්ෂික වාර්තාව වාර්ෂික සම්මේලනයට ඉදිරිපත් කිරීම.

9.3.5. පක්ෂ සම්මේලනයේ, මධ්‍යම කාරක සභාවේ සහ දේශපාලන මණ්ඩලයේ වාර්තා පවත්වාගෙන යෑම.

9.3.6. සාමාජික ලේඛණය යාවත්කාලීන කිරීම, නිරවද්‍යතාව සහතික කිරීම සහ අවශ්‍ය ආයතන හෝ පුද්ගලයින්ට නිකුත් කිරීම.

9.4. ජාතික සංවිධායක

9.4.1. දිසා ජනසභා අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.

9.4.2. ආසන ජන සභා සහ ශාඛා පිහිටුවමින් පක්ෂ ජාලය ව්‍යාප්ත කිරීම.

9.4.3. ජාතික සභාව කැඳවීම සහ පක්ෂ නායක හෝ උප සභාපතිවරුන් නොමැති අවස්ථාවන්හි මූලසුන දැරීම.

9.4.4. ජාතික මණ්ඩලය විසින් අධීක්ෂණය නොකරන පක්ෂයේ අනු සංවිධාන සහ අනුබද්ධිත සංවිධාන පිහිටුවීම, ඒවායේ කටයුතු අධීක්ෂණය සහ වාර්තා කිරීම.

9.5. භාණ්ඩාගාරික

9.5.1. පක්ෂයේ අරමුදල් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම.

9.5.2. පක්ෂයේ වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම.

9.5.3. මාසික ගිණුම් ප්‍රකාශන මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කිරීම.

9.5.4. වාර්ෂික ගිණුම් වාර්තාව තමන්ගේ සහ නියෝජ්‍ය භාණ්ඩාගාරිකගේ අත්සනින් විගණන වාර්තාවක් සමග පක්ෂයේ ජාතික සභාවට ඉදිරිපත් කිරීම.

9.5.5. විගණකවරයා සමග සම්බන්ධිකරණය

9.6. නියෝජ්‍ය සභාපතිවරු

9.6.1. නියෝජ්‍ය සභාපතිවරු දෙදෙනෙකි. සියළු දෙනාම ජ්‍යෙෂ්ඨත්වයෙන් සමානය.

9.6.2. පළමු නියෝජ්‍ය සභාපති විනය මණ්ඩලයේ සභාපති ධූරය දැරිය යුතුය.

9.6.3. දෙවන නියෝජ්‍ය සභාපති ජාතික මණ්ඩලයේ සහ එහි අනුමණ්ඩලයන්හි කටයුතු අධීක්ෂණය කළ යුතුය.

9.7. නියෝජ්‍ය භාණ්ඩාගාරික

9.7.1. මූල්‍ය අනුමණ්ඩලයේ මූලසුන දැරීම.

9.7.2. පක්ෂ අරමුදල ඉහළ නැංවීමට කටයුතු කිරීම.

9.8. පරිපාලන ලේකම්

9.8.1. නායකගේ අධීක්ෂණය යටතේ මූලස්ථානයේ පරිපාලන කටයුතු මෙහෙයවීම.

9.8.2. ප්‍රධාන ලේකම්ගේ අධීක්ෂණය යටතේ මධ්‍යම කාරක සභා වාර්තා සහ සාමාජික ලේඛණ පවත්වා ගෙන යෑම.

9.8.3. භාණ්ඩාගාරිකගේ අධීක්ෂණය යටතේ මුදල් වැය කිරීම සහ ඒ පිළිබඳ ගිණුම් තැබීම.

9.8.4. භාණ්ඩාගාරිකගේ අධීක්ෂණය යටතේ වත්කම් ලේඛන පවත්වා ගෙන යෑම.

9.9. සෑම ප්‍රධාන නිළධාරියෙකුම ඉල්ලා අස්වීමක් හෝ අස් කිරීමක් සිදු නොවුණොත් පක්ෂ සම්මේලනයක දී නව ප්‍රධාන නිළධාරි මණ්ඩලයක් පත් කරන තෙක් ධූරය දරන්නේය.

9.10. ප්‍රධාන නිළධාරියෙකු ඉල්ලා අස්වීම

9.10.1. ඕනෑම නිළධාරියෙකුට පක්ෂයේ නායකට ලිපියකින් දැනුම් දීමෙන් තමන් දරන තනතුරෙන් ඉල්ලා අස්විය හැක.

9.10.2. නායක විසින් නම් කරන යම් මධ්‍යම කාරක සභිකයෙකුට එකී අස්වන නිළධාරියා විසින් ඔහුගේ භාරයේ පැවැති පක්ෂයේ වත්කම් සහ ලේඛණ වහාම භාරදිය යුතුය.

9.10.3. එකී ඉල්ලා අස්වීමේ ලිපිය නායක විසින් මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය.

9.10.4. ඉල්ලා අස්වන්නේ නායක නම් නායකට පැවරී ඇති බලතල සහ වගකීම් මධ්‍යම කාරක සභාව විසින් නියෝජ්‍ය නායකයෙකුට පැවරේ.

9.11. ප්‍රධාන නිළධාරියෙකු අස්කිරීම

9.11.1. යම් ප්‍රධාන නිළධාරියෙකු එම ධූරයෙන් ඉවත් කිරීමට යෝජනා කරමින් ද ඊට හේතු දක්වමින් ද මධ්‍යම කාරක සභාවට යම් සභිකයෙකු ගෙනෙන යෝජනාවක් විශේෂ බහුතරය සහිතව සම්මත වන්නේ නම් එකී නිළධාරියාට ඔහු දැරූ ධූරය අහිමි වන්නේය.

9.11.2. යම් ප්‍රධාන නිළධාරියෙකු ධූරයෙන් ඉවත් කිරීමට ගෙනෙන ලද යෝජනාවක් පිළිබඳ ඡන්දය විමසීමට පෙර සිය නිදහසට කරුණු දැක්වීමට අදාළ නිළධාරියාට අවස්ථාව ලබාදිය යුතුය.

9.11.3. එකී නිළධාරියා එකී සභාවට සහභාගී වී නොමැති නම්

9.11.3.1. සති තුනකට නොඅඩු සති හතරකට නොවැඩි දිනයක දී යළි මධ්‍යම කාරක සභා රැස්වීම පැවැත්වීමට සභාව තීරණය කළ යුතුය.

9.11.3.2. එකී දිනය, වේලාව සහ ස්ථානය ද එකී නිළධාරියාට එරෙහිව නැගී ඇති චෝදනාව ද ලිඛිතව දින දෙකක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් එකී නිළධාරියාට දැනුම් දීම ප්‍රධාන ලේකම්ගේ වගකීමක් වන්නේය.

9.11.3.3. එකී ලිපියෙන් තමන්ට එරෙහිව නගා ඇති චෝදනාවන්ට පිළිතුරු සති දෙකක් ඇතුලත ප්‍රධාන ලේකම්ට ලිඛිතව ලැබීමට සැලැස්විය යුතුය.

9.11.3.4. දෙවනුව කැඳවන ලද සභාවට එකී නිළධාරියා සහභාගී වී ඇත්නම් ඔහුගේ වාචික නිදහසට කරුණු දැක්වීමට ද එසේ සහභාගී වී නොමැති නම් හෝ වාචිකව කරුණු දැක්වීම ඔහු ප්‍රතික්ෂේප කරයි නම් ඔහු විසින් ලිඛිතව එවන ලද නිදහසට කරුණු දැක්වීම සළකා බැලීමෙන් පසු ඔහුව නෙරපීමට ඉදිරිපත් කර ඇති යෝජනාව සඳහා ඡන්දය විමසිය යුතුය.

9.11.3.5. එකී යෝජනාවේ මධ්‍යම කාරක සභික ධූරයෙන් ද ඉවත් කිරීමට යෝජනා කර ඇත්නම් ඔහුට මධ්‍යම කාරක සභිකත්වය ද අහිමි වන්නේය.

9.11.3.6. යම් ප්‍රධාන නිළධාරියෙකු ඔහු දැරූ තනතුරින් ඉවත් කළ බව දැනගත් වහාම මධ්‍යම කාරක සභාව විසින් නියම කරන වෙනත් මධ්‍යම කාරක

සභිකයෙකුට ඔහුගේ භාරයේ පැවැති පක්ෂයේ වත්කම් සහ ලේඛණ වහාම භාරදිය යුතුය.

9.11.3.7. මෙම ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුවත් නායක ඉවත් කළ හැක්කේ ජාතික සභාවේ දී විශේෂ බහුතරයකින් සම්මත වන යෝජනාවක් මගින් පමණි.

9.11.3.8. නායක ඉවත් කළ යුතු බවට ඊට හේතු දැක්වෙන යෝජනාවක් මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කර ඇති අවස්ථාවක මුලින්ම කළ යුත්තේ උප සභාපතිවරයෙකුට මුලසුන භාර දීමයි.

9.11.3.9. එකී යෝජනාවට එරෙහිව කරුණු දැක්වීමට නායකට අවස්ථාවක් ලබා දිය යුතුය.

9.11.3.10. එකී යෝජනාවට ඡන්දය විමසීමේ දී මුලසුන දරණ උප සභාපතිවරයා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකිය යුතුය.

9.11.3.11. මධ්‍යම කාරක සභාවේ විශේෂ බහුතරයෙන් එකී යෝජනාව සම්මත වන්නේ නම් ජාතික සංවිධායක විසින් සති දෙකකට නොඅඩු සති තුනකට නොවැඩි දිනයක ජාතික සභාව කැඳවිය යුතුය.

9.11.3.12. එකී කැඳවීමේ ලිපියේ මධ්‍යම කාරක සභාව විසින් අනුමත කළ යෝජනාව ද ඊට එරෙහිව නායක විසින් දක්වන කරුණු සහිත ඔහුගේ ප්‍රකාශයක් ද ඇතුලත් කළ යුතුය. නායක විසින් යෝජනාව සම්මත වී දින තුනක් ඇතුලත සිය ප්‍රකාශය ජාතික සංවිධායකට භාර දිය යුතුය.

9.11.3.13. එකී ජාතික සභාවේ රැස්වීමට නායක සහභාගි වුවත් මුලසුන දැරිය යුත්තේ එකී යෝජනාව සම්මත වන විට මුලසුන දැරූ උපසභාපතිවරයාය.

9.11.3.14. යෝජනාව ඉදිරිපත් කළ මධ්‍යම කාරක සභා කණ්ඩායම තෝරා ගත් මධ්‍යම කාරක සභිකයෙකු විසින් යෝජනාව ඉදිරිපත් කර ඊට පක්ෂව උපරිම වශයෙන් විනාඩි 30ක් කතා කළ යුතුය.

9.11.3.15. ඉන්පසු ඊට එරෙහිව කරුණු දැක්වීම සඳහා නායකට විනාඩි 30 කාලයක් ලබා දිය යුතුය.

9.11.3.16. ඉන්පසු කරුණු පැහැදිලි කර ගැනීම සඳහා සභිකයින්ට යෝජනාව ඉදිරිපත් කළ මධ්‍යම කාරක සභිකයාගෙන් සහ නායකගෙන් ප්‍රශ්න පහ බැගින් ඇසිය හැක.

9.11.3.17. ඉන්පසු පක්ෂ විගණකගේ පූර්ණ අධීක්ෂණය යටතේ මුලසුන දරණ උපසභාපති විසින් පක්ෂ මුලස්ථානයේ සේවය කරන නිලධාරීන්ගේ සහයෙන් රහස් ඡන්දයක් පැවැත්විය යුතුය.

9.11.3.18. මුලසුන දරණ උපසභාපති, විගණක, යෝජක හා නායක සහ ඔවුන් දෙදෙනා විසින් නම් කළ දෙදෙනෙකු ඉදිරියේ ඡන්දය ගණන් කිරීම සිදු කළ යුතුය.

9.11.3.19. නායක ඉවත් කිරීමේ යෝජනාව ජාතික සභාවේ විශේෂ බහුතරයකින් සම්මත වී ඇත්නම් මුලසුන දරණ උපසභාපති නම් කරන නියෝජ්‍ය නායකයෙකුට නායක භාරයේ පැවැති සියළුම පක්ෂයේ දේපල භාර දී තනතුරෙන් සමු ගත යුතුය.

9.11.4. වැඩ බැලීම සඳහා පත් කිරීම

9.11.4.1. යම් නිලධාරියෙකු විදේශ ගත වීම, අසනීප වීම හෝ වෙනත් එවැනි හේතුවක් මත සිය ධූරයේ රාජකාරි ඉටු කිරීමට අපොහොසත් යැයි නායක සිතන්නේ

නම් එම තනතුරේ වැඩ බැලීම සඳහා මධ්‍යම කාරක සභිකයෙකු පත් කිරීමට නායකට පුළුවන.

9.11.4.2. එකී නිලධාරියාගේ එකී අපොහොසත්කම දුරු වූ විට එකී වැඩ බැලීමේ පත්වීම අවසන් කරමින් නායකගේ අත්සනින් යුත් ලිපියක් එකී නිලධාරියාට ද පිටපතක් සහිතව වැඩ බලන මධ්‍යම කාරක සභිකට යැවිය යුතුය.

9.11.4.3. වැඩ බැලීමට නිලධාරියෙකු පත් කරන්නේ ප්‍රධාන ලේකම් ධූරයට නම් එකී පත්වීමේ ලිපියේ ද පත්වීම අවසන් කිරීමේ ලිපියේ ද පිටපත් මැතිවරණ කොමිසමට යැවිය යුතුය.

9.11.5. නිලධාරියෙකුගේ තනතුර අත්හිටුවීම

9.11.5.1. යම් ප්‍රධාන නිලධාරියෙකු එම තනතුර දැරීම පක්ෂයේ මනා පැවැත්මට තර්ජනයක් යැයි පක්ෂ නායක අදහස් කරයි නම් ඔහු එම තනතුර දැරීම අත්හිටුවා ඒ තනතුරේ වැඩ බැලීම වෙනත් මධ්‍යම කාරක සභිකයෙකුට පැවරිය හැකිය.

9.11.5.2. එකී අත්හිටුවීම සිදු කරන දින එසේ කිරීමට හේතු ලිඛිතව එකී නිලධාරියාට දැක්විය යුතුය.

9.11.5.3. එකී නිලධාරියාට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට ඇත්නම්

9.11.5.4. එකී අත්හිටුවීම සිදු කර මාසයක් ඇතුලත මධ්‍යම කාරක සභාව කැඳවා එකී අත්හිටුවීම අනුමත නොකලොත් එතැන් සිට සති දෙකක් සම්පූර්ණ වීමෙන් පසු අත්හිටුවීම අහෝසි වන්නේය.

9.11.5.5. තනතුර අත්හිටුවා ඇති නිලධාරියාගේ මධ්‍යම කාරක සභික ධූරය ද අත්හිටුවා ඇත්නම් නම් එකී අත්හිටුවීම නොසලකා ඔහුට ද එකී අත්හිටුවීම සලකා බලන මධ්‍යම කාරක සභාවට සහභාගී වී අදහස් දැක්වීමට ද ඡන්දය පාවිච්චි කිරීමට ද අයිතිය ඇත.

9.11.5.6. තනතුර අත්හිටුවීම සිදු කලේ ප්‍රධාන ලේකම් තනතුර දැරූ අයගේ නම් එකී අත්හිටුවීම ද ප්‍රධාන ලේකම් තනතුරේ වැඩ බැලීමට පත් කළ අයගේ නම ද සඳහන් ලිපියක් පක්ෂ නායකගේ අත්සනින් වහාම මැතිවරණ කොමිසමට දැනුම් දිය යුතුය.

10. මධ්‍යම කාරක සභාව

10.1. සංයුතිය

මධ්‍යම කාරක සභාව විසිඑක් දෙනෙකුට අඩු නොවූ ද තිස්පස් දෙනෙකුට වැඩි නොවූ ද සාමාජිකයින් පිරිසකගෙන් සමන්විත විය යුතුය. එහි සංයුතිය පහත දැක්වෙන පරිදිය.

11.1.1. නායක, ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය නායකයින් දෙදෙනා, ජාතික සංවිධායක, භාණ්ඩාගාරික, නියෝජ්‍ය සභාපතිවරු දෙදෙනා, නියෝජ්‍ය ජාතික සංවිධායකවරු දෙදෙනා සහ නියෝජ්‍ය භාණ්ඩාගාරික

11.1.2. පරිපාලන ලේකම්

11.1.3. විෂයානුබද්ධ කමිටුහි ලේකම්වරුන්

11.1.4. ප්‍රාදේශීය නියෝජනය සැලකිල්ලට ගනිමින් උපරිමය දස දෙනෙකුට යටත්ව පත් කරන සාමාජිකයින්

11.1.5. විශේෂ හේතුන් මත පත් කරන උපරිමය පස්දෙනෙකුට යටත්ව පත් කරන සාමාජිකයින්

11.1.6. පක්ෂය නියෝජනය කරන සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම නිරීක්ෂකයෙකු ලෙස මධ්‍යම කාරක සභාවට සහභාගි විය හැක. නමුත් යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මධ්‍යම කාරක සභාවට සහභාගි වීම තහනම් කළ යුතු බවට මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යෝජනාවක් පූර්ණ සරල බහුතරයෙන් සම්මත වුවහොත් එකී මන්ත්‍රීවරයාට මධ්‍යම කාරක සභාවට සහභාගි වීමේ අයිතිය අහිමි වේ.

10.2. රැස්වීම

10.2.1. මධ්‍යම කාරක සභාව රැස්විය යුතු දින, රැස්වීම් සඳහා දැනුම්දිය යුතු ආකාරය මෙන්ම රැස්වන ස්ථානය ද මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

10.2.2. නායක හෝ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින්ගෙන් තුනෙන් එකක් ඉල්ලීමක් කළොත් ප්‍රධාන ලේකම් විසින් දින හතක් ඇතුලත මධ්‍යම කාරක සභාව කැඳවිය යුතුය.

10.2.3. ඉහත ආකාරයෙන් ප්‍රධාන ලේකම්ට මධ්‍යම කාරක සභාව කැඳවීමට උපදෙස් දී දින තුනක් ඇතුලත මධ්‍යම කාරක සභාව කැඳවීමේ දැනුම්දීම කිරීම පැහැර හැරියොත් නායකට මධ්‍යම කාරක සභාව කැඳවීමට හැක.

10.3. කාර්යයන්, වගකීම් සහ බලතල

10.3.1. පක්ෂයේ සාමාජිකත්වය පිළිබඳ නීති පැනවීම හා සාමාජිකත්වය වර්ධනය කිරීම.
10.3.2. පක්ෂයේ පරිපාලන නිළධාරින් පත් කිරීම, බලතල නිර්ණය කිරීම සහ ඉවත් කිරීම.
10.3.3. පක්ෂය වෙනුවෙන් නඩු පැවරීම.
10.3.4. පක්ෂයට දේපල අත්පත් කර ගැනීම, පරිපාලනය සහ අන්සතු කිරීම.
10.3.5. පක්ෂ අරමුදල් පරිපාලනය
10.3.6. බැංකු ගිණුම් විවෘත කර පවත්වාගෙන යෑම.
10.3.7. පක්ෂය වෙනුවෙන් ණය ලබා ගැනීම සහ ණය දීම.
10.3.8. පක්ෂයේ ගිණුම් විගණනය සඳහා සුදුසුකම්ලත් විගණකයෙකු පත් කිරීම.
10.3.9. බාහිර පාර්ශව සමග ගිවිසුම් ඇති කර ගැනීම.
10.3.10. පක්ෂයේ සාමාජිකයින් පිළිබඳ විනය ක්‍රියාමාර්ග ගැනීම.
10.3.11. දිසා ජනසභා, ආසන ජනසභා, ශාඛා ජනසභා සහ විදේශීය ජනසභා සඳහා අතුරු ව්‍යවස්ථා හඳුන්වාදීම සහ අවශ්‍ය පරිදි සංශෝධනය කිරීම.
10.3.12. සාමාජිකයින්ගේ විනය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා හඳුන්වාදීම සහ අවශ්‍ය පරිදි සංශෝධනය කිරීම.
10.3.13. මැතිවරණ සඳහා පක්ෂයේ අපේක්ෂකයින් නම් කිරීම.
10.3.14. අපේක්ෂකයින් තේරීමේ පටිපාටිය නිර්ණය කිරීම.
10.3.15. මැතිවරණ මෙහෙයවන ආකාරය තීරණය කිරීම.
10.3.16. මහජන නියෝජිතයාතනයන්හි පක්ෂයේ නියෝජිතයින්ට දැරිය හැකි තනතුරු සඳහා පුද්ගලයින් නම් කිරීම.
10.3.17. පක්ෂය ජාතික මට්ටමින් හෝ ප්‍රාදේශීය මට්ටමින් විධායකයට සම්බන්ධ වන්නේ නම් පක්ෂය වෙනුවෙන් ඇමති ධූර හෝ ඊට සමාන වෙනත් තනතුරු සඳහා පුද්ගලයින් නම් කිරීම.
10.3.18. අවස්ථානුරූපීව කමිටු සහ අනුකමිටු පත් කිරීම.
10.3.19. ඊළඟ පක්ෂ සම්මේලනය දක්වා වූ කාලය සඳහා නිළධාරි මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම.

10.3.20. පක්ෂ ව්‍යවස්ථාව මගින් වෙනත් නිළධාරියෙකුට හෝ ආයතනයකට නිශ්චිතව පවරා නැති ඕනෑම බලතලයක් හෝ කාර්රයක්

10.4. සෑම මධ්‍යම කාරක සභිකයෙකුම ඉල්ලා අස්වීමක් හෝ අස් කිරීමක් සිදු නොවුණොත් පක්ෂ සම්මේලනයක දී නව මධ්‍යම කාරක සභාවක් පත් කරන තෙක් ධූරය දරන්නේය.

10.5. මධ්‍යම කාරක සභිකයෙකු ඉල්ලා අස්වීම

10.5.1. ඕනෑම මධ්‍යම කාරක සභිකයෙකුට පක්ෂයේ ප්‍රධාන ලේකම්ට ලිපියකින් දැනුම් දීමෙන් තමන් දරන තනතුරෙන් ඉල්ලා අස්විය හැක.

10.5.2. ප්‍රධාන ලේකම් විසින් නම් කරන යම් මධ්‍යම කාරක සභිකයෙකුට එකී අස්වන සභිකයා විසින් ඔහුගේ භාරයේ පැවැති පක්ෂයේ වත්කම් සහ ලේඛණ වහාම භාරදිය යුතුය.

10.5.3. එකී ඉල්ලා අස්වීමේ ලිපිය ප්‍රධාන ලේකම් විසින් මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය.

10.6. මධ්‍යම කාරක සභිකයෙකු අස්කිරීම

10.6.1. යම් මධ්‍යම කාරක සභිකයෙකු එම ධූරයෙන් පහ කිරීමට යෝජනා කරමින් ද ඊට හේතු දක්වමින් ද මධ්‍යම කාරක සභාවට යම් සභිකයෙකු ගෙනෙන යෝජනාවක් පූර්ණ සරල බහුතරය සහිතව සම්මත වන්නේ නම් එකී සභිකයාට ඔහු දැරූ ධූරය අහිමි වන්නේය.

10.6.2. එකී යෝජනාව ඡන්දය විමසීමට පෙර සිය නිදහසට කරුණු දැක්වීමට අදාළ සභිකයාට අවස්ථාව ලබාදිය යුතුය. නිදහසට කරුණු දැක්වීම සම්බන්ධයෙන් ප්‍රධාන නිළධාරියෙකු අස්කිරීම සම්බන්ධයෙන් පවතින විධිවිධාන මධ්‍යම කාරක සභිකයින්ට ද අනුරූපීව අදාළ වේ.

10.6.3. යම් මධ්‍යම කාරක සභිකයෙකු ඔහු දැරූ තනතුරින් ඉවත් කළ බව දැනගත් වහාම ප්‍රධාන ලේකම් විසින් නියම කරන වෙනත් මධ්‍යම කාරක සභිකයෙකුට ඔහුගේ භාරයේ පැවැති පක්ෂයේ වත්කම් සහ ලේඛණ වහාම භාරදිය යුතුය.

10.7. මධ්‍යම කාරක සභිකත්වය අහිමිවීම

10.7.1. පක්ෂ සාමාජිකත්වය අහිමිවීම.

10.7.2. වයස අවුරුදු හැත්තෑව (70) සම්පූර්ණවීම.

10.7.3. පූර්ව අවසරයක් ලබා නොගෙන අඛණ්ඩව වාර තුනක් මධ්‍යම කාරක සභා රැස්වීම් සඳහා සහභාගී නොවීම හේතුවෙන් මධ්‍යම කාරක සභිකත්වයෙන් නෙරපා දැමීමට ඉදිරිපත් වන යෝජනාවක් මධ්‍යම කාරක සභාවේ පූර්ණ සරල බහුතරයෙන් සම්මතවීම.

10.7.4. යම් දිනකට පෙර පැවැති වසර තුල පවත්වා ඇති මධ්‍යම කාරක සභා රැස්වීම් වලින් 50%කට වැඩි රැස්වීම් ගණනකට පෙර අවසරයකින් තොරව නොපැමිණීම හේතුවෙන් මධ්‍යම කාරක සභිකත්වයෙන් නෙරපා දැමීමට ඉදිරිපත් වන යෝජනාවක් මධ්‍යම කාරක සභාවේ සරල බහුතරයෙන් සම්මතවීම.

10.7.5. මධ්‍යම කාරක සභාවේ අවසරයකින් තොරව මහජන නියෝජිතයෙකු ලෙස හෝ ආණ්ඩුකාරවරයෙකු, ජනාධිපති උපදේශකවරයෙකු, ඇමති උපදේශකවරයෙකු හෝ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ රජයේ සමාගමක සභාපතිවරයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ වෙනත් ඊට සමාන තනතුරක් බාර ගැනීම. (එකී තනතුර භාරගත් බවට රජයේ නිල ලේඛණයක සඳහන්ව පැවතීම මධ්‍යම කාරක සභිකත්වය අහිමිවීම සඳහා ප්‍රමාණවත්ය).

11. දේශපාලන මණ්ඩලය

11.1. සංයුතිය

11.1.1. දේශපාලන මණ්ඩලය හත්දෙනෙකුට අඩු නොවූ ද එකලොස්දෙනෙකුට වැඩි නොවූ ද සාමාජිකයින් පිරිසකගෙන් සමන්විත විය යුතුය.

11.1.2. පක්ෂ නායක, නියෝජ්‍ය නායක, ප්‍රධාන ලේකම් සහ ජාතික සංවිධායක නිල බලයෙන් දේශපාලන මණ්ඩලයේ සාමාජිකයින් වේ.

11.1.3. අනෙකුත් සාමාජිකයින් නායකගේ නිර්දේශය මත මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය.

11.1.4. දේශපාලන මණ්ඩලයේ මුලසුන හොබවන්නේ නායකයි.

11.1.5. පක්ෂ සම්මේලනයෙන් පසු රැස්වන පළමු මධ්‍යම කාරක සභා රැස්වීමේ දි නව දේශපාලන මණ්ඩලයක් පත් කළ යුතු අතර එසේ පත් කරන දේශපාලන මණ්ඩලය ඊ ළඟ දේශපාලන මණ්ඩලය පත් කරන තෙක් ධූර දරන්නේය.

11.2. බලතල

11.2.1. ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතු දේශපාලන කාරණා පිළිබඳ පක්ෂයේ ස්ථාවරය තීරණය කිරීම.

11.2.2. මධ්‍යම කාරක සභාව රැස් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති අවස්ථාවන්හි මධ්‍යම කාරක සභාව වෙනුවෙන් දේශපාලන තීන්දු ගැනීම.

11.2.3. මධ්‍යම කාරක සභාව විසින් එකී සභාව වෙනුවෙන් තීරණ ගැනීමට බලය පවරන විෂයන් සහ කාරණා සම්බන්ධයෙන් තීන්දු ගැනීම.

12. ජාතික සභාව

12.1. සංයුතිය

12.1.1. මධ්‍යම කාරක සභිකයින්

12.1.2. පක්ෂයේ සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

12.1.3. පක්ෂයේ සියළුම පලාත් සභා මන්ත්‍රීවරුන්

12.1.4. සෑම සක්‍රිය දිසා ජන සභාවක සභාපති, ලේකම්, සංවිධායක සහ භාණ්ඩාගාරික

12.1.5. සෑම විෂයානුබද්ධ අනු කමිටුවකම ලේකම් හෝ ඔහු විසින් ජාතික සභාවට එවන නියෝජිතයෙකු

12.2. රැස්වීම්

12.2.1. ජාතික සභාව කැඳවන්නේ ජාතික සංවිධායකයි.

12.2.2. පක්ෂ නායක හෝ නියෝජ්‍ය නායක රැස්වීමට සහභාගි නොවන්නේ නම් මුලසුන හොබවන්නේ ජාතික සංවිධායකයි.

12.2.3. අවම වශයෙන් දෙමසකට එක් වරක්වත් ජාතික සභාව කැඳවිය යුතුය.

12.3. බලතල සහ කාර්යයන්

12.3.1. දිසා ජන සභාවන්හි පරිපාලන ගැටළු සාකච්ඡා කිරීම.

12.3.2. දිසා ජන සභාවන්හි ප්‍රගති සමාලෝචනය

12.3.3. දිසා ජනසභා සහ විෂයානුබද්ධ කමිටු අතර ගැටළු නිරාකරණය

12.3.4. පක්ෂ සාමාජිකයින් අමාත්‍ය ධූර දරණ අමාත්‍යාංශ සහ පක්ෂ ජාලය අතර ගැටළු නිරාකරණය
12.3.5. වාර්ෂික ගිණුම් සමාලෝචනය කර අනුමත කිරීම.
12.3.6. වාර්ෂික විගණන වාර්තාව අධ්‍යනය කර පක්ෂයේ සිදුවිය යුතු පරිපාලනමය වෙනස්කම් මධ්‍යම කාරක සභාවට දැනුම් දීම.

13. ජාතික මණ්ඩලය

13.1. සංයුතිය

13.1.1. මධ්‍යම කාරක සභාව නම් කරන නියෝජ්‍ය සභාපති වරයෙකු මණ්ඩලයේ සභාපති වන්නේය.
13.1.2. ජාතික සංවිධායක
13.1.3. පරිපාලන ලේකම්
13.1.4. අනුමණ්ඩලයන්හි ලේකම්වරුන්

13.2. බලතල සහ කාර්යයන්

13.2.1. අනුමණ්ඩල සඳහා වගකීම, කාර්යයන් සහ ඉලක්ක ලබාදීම.
13.2.2. අනුමණ්ඩලයන්හි ප්‍රගති සමාලෝචනය
13.2.3. අන්තර් අනුමණ්ඩල සම්බන්ධිකරණය
13.2.4. ඒ ඒ අනුමණ්ඩලයේ විෂය පථයට අයත් අනුබද්ධ සහ ආශ්‍රිත සංවිධානයන්හි කාර්යයන් නිර්ණය කිරීම සහ ප්‍රගති සමාලෝචනය

14. විනය මණ්ඩලය

14.1. මධ්‍යම කාරක සභාව නම් කරන නියෝජ්‍ය සභාපතිවරයෙකු විනය මණ්ඩලයේ සභාපති වේ.
14.2. පරිපාලන ලේකම් නිල බලයෙන් විනය මණ්ඩලයේ ලේකම් වේ.
14.3. සභාපතිට අමතරව සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.
14.4. මධ්‍යම කාරක සභිකයින් අතුරෙන් නියෝජ්‍ය සභාපති විසින් විනය මණ්ඩලයේ සාමාජිකයින් පත් කළ යුතුය.
14.5. විනය මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කිරීමේ යම් ප්‍රායෝගික දුෂ්කරතාවයක් නම් කරන ලද නියෝජ්‍ය සභාපතිට ඇත්නම් ඒ සඳහා වෙනත් නියෝජ්‍ය සභාපතිවරයෙකු පත් කිරීමට නියෝජ්‍ය සභාපතිට හැක.
14.6. විනය මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කිරීමේ යම් ප්‍රායෝගික දුෂ්කරතාවයක් පරිපාලන ලේකම්ට ඇත්නම් ඒ සඳහා වෙනත් අයෙකු පත් කිරීමට පරිපාලන ලේකම්ට හැක. නමුත් විනය මණ්ඩල සභාපතිට වගකිවයුත්තේ පරිපාලන ලේකම්ය.

15. අනුබද්ධිත සංවිධාන

15.1. මධ්‍යම කාරක සභාවේ අභිමතය පරිදි පක්ෂයට අනුබද්ධිත සංවිධාන ඕනෑම ගණනක් පිහිටුවිය හැක.
15.2. එකී සංවිධානයේ කටයුතු යම් අනුමණ්ඩලයක විෂය පථයට වැටේ නම් එකී අනුමණ්ඩලයේ ලේකම් හරහා අදාළ නියෝජ්‍ය සභාපති විසින් අනුබද්ධ සංවිධානයේ කටයුතු අධීක්ෂණය කළ යුතුය.
15.3. අනුබද්ධිත සංවිධානයේ කටයුතු යම් අනුමණ්ඩලයක විෂය පථයට නොවැටේ නම් එකී සංවිධානයේ කටයුතු අදාළ නියෝජ්‍ය සභාපති සෘජුව අධීක්ෂණය කළ යුතුය.

16. පක්ෂ සම්මේලනය

16.1. සංයුතිය

16.1.1. මධ්‍යම කාරක සභිකයින්

16.1.2. පක්ෂයේ සියළුම මහජන නියෝජිතයින්

16.1.3. සෑම අනුමණ්ඩලයකින්ම තුන්දෙනා බැගින් සහභාගි වන නියෝජිතයින්

16.1.4. සෑම සක්‍රිය දිසා සභාවක සභාපති, ලේකම්, සංවිධායක සහ භාණ්ඩාගාරික

16.1.5. මතු දැක්වෙන කරුණු මත පදනම්ව තෝරාගත් සක්‍රිය දිසා සභාවන්හි නියෝජිතයින්

16.1.5.1. දිසා සභාවේ ක්‍රියාකාරිත්වය

16.1.5.2. දිසා සභාවේ සාමාජික සංඛ්‍යාව

16.1.5.3. පසුගිය මැතිවරණයන්හි ඒ දිසාවෙන් පක්ෂයට ලැබුණු ඡන්ද සංඛ්‍යාව හෝ මන්ත්‍රී සංඛ්‍යාව

16.1.6. නිරීක්ෂක මට්ටමින් සහභාගි වන පක්ෂ සාමාජිකයින් නොවන ආරාධිතයින්

16.2. රැස්වීම් කැඳවීම

16.2.1. මතු දැක්වෙන ඕනෑම අවස්ථාවක දී ප්‍රධාන ලේකම් විසින් පක්ෂ සම්මේලනය කැඳවිය යුතුය.

16.2.1.1. පක්ෂ නායක විසින් පක්ෂ සම්මේලනය කැඳවන මෙන් උපදෙස් දුන්විට

16.2.1.2. පක්ෂ සම්මේලනය කැඳවන මෙන් මධ්‍යම කාරක සභාවේ යෝජනාවක් සම්මත වූ විට

16.2.1.3. පක්ෂ සම්මේලනය කැඳවන මෙන් ජාතික සභාවේ යෝජනාවක් සම්මත වූ විට

16.2.1.4. පක්ෂ සම්මේලනය කැඳවන මෙන් දිසා සභාවන් පහක් විසින් ප්‍රධාන ලේකම්ගෙන් ඉල්ලා සිටි විට

16.2.2. පක්ෂ සම්මේලනයට සහභාගි වන්නේ සැබවින්ම ආරාධනා ලැබූවන්දැයි තහවුරු කර ගැනීම සඳහා අවස්ථානුකූල පියවර ප්‍රධාන ලේකම් විසින් ගත යුතුය.

16.3. වාර්ෂික පක්ෂ සම්මේලනය

16.3.1. සෑම වසරකම එක් වරක් පැවැත්විය යුතුය.

16.3.2. මතු දැක්වෙන කරුණු එකී සම්මේලනයේ න්‍යාය පත්‍රයේ අඩංගු විය යුතුය.

16.3.2.1. නව මධ්‍යම කාරක සභාවක් පත්කර ගැනීම.

16.3.2.2. ප්‍රධාන ලේකම්වරයාගේ වාර්ෂික වාර්තාව අනුමත කිරීම.

16.3.2.3. විශේෂ යෝජනා සම්මත කර ගැනීම.

16.4. විශේෂ පක්ෂ සම්මේලන

16.4.1. වසරක් තුල ඕනෑම වාර ගණනක් ව්‍යවස්ථානුකූලව විශේෂ පක්ෂ සම්මේලන කැඳවිය හැක.

16.4.2. විශේෂ පක්ෂ සම්මේලනයක න්‍යාය පත්‍රයේ මතු දැක්වෙන කරුණු අඩංගු විය හැක.

16.4.2.1. පක්ෂ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

16.4.2.2. පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ගත් වැදගත් තීරණ පිළිබඳ සාමාජිකත්වය දැනුම්වත් කිරීම.

16.5. විශේෂ යෝජනා

16.5.1. මතු දැක්වෙන ඕනෑම ආකාරයකට විශේෂ යෝජනාවක් පක්ෂ සම්මේලනයට ඉදිරිපත් කළ හැක.

16.5.1.1. සක්‍රිය දිසා සභාවක් සම්මත කරන ලද යෝජනාවක් පක්ෂ සම්මේලනයට දින දහහතරකට පෙර ප්‍රධාන ලේකම්වරයාට එවීමෙන්

16.5.1.2. අනුමණ්ඩලයක් විසින් සම්මත කළ යෝජනාවක් පක්ෂ සම්මේලනයට දින දහහතරකට පෙර ප්‍රධාන ලේකම්වරයාට එවීමෙන්

16.5.1.3. පක්ෂ සාමාජිකයෙකු විසින් සම්මේලනයට දින තිහකට පෙර ප්‍රධාන ලේකම්ට එවන ලද යෝජනාවක් සම්මේලනයට ඉදිරිපත් කළ යුතු යැයි මධ්‍යම කාරක සභාව තීරණය කිරීමෙන්

16.5.2 දිසා සභාවක යෝජනාවක් නම් දිසා සභාව විසින් නම් කළ නිළධාරියෙකු විසින් ද අනුමණ්ඩලයක යෝජනාවක් නම් අනුමණ්ඩලය විසින් නම් කළ සාමාජිකයෙකු විසින් ද සාමාජික යෝජනාවක් නම් එකී සාමාජිකයා විසින් ද යෝජනාව සම්මේලනයට ඉදිරිපත් කළ යුතුය.

16.5.2. යෝජනා ඉදිරිපත් කරන සාමාජිකයින්ට අනිවාර්රයෙන්ම පක්ෂ සම්මේලනයට ආරාධනා කළ යුතුය.

16.5.3. යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් පසු එකී සාමාජිකයා වේදිකාව මත සිටියදී එම යෝජනාවට ඡන්දය විමසිය යුතුය.

16.5.4. යම් යෝජනාවකට රහස් ඡන්දයක් තැබිය යුතු යැයි පක්ෂ නායක තීරණය නොකළොත් අත් එසවීමෙන් ඡන්දය ප්‍රකාශ කළ යුතුය.

16.5.5. සම්මත වන යෝජනා ඉදිරි වර්ෂය තුල මධ්‍යම කාරක සභාව විසින් ක්‍රියාවට නගන බවට වග බලා ගැනීම නායකගේ වගකීමක් වන අතර ඔහු විසින් පක්ෂ සම්මේලනය අමතන අවස්ථාවෙහි පසුගිය සම්මේලනයේ දී සම්මත වූ යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය දැනුම්දිය යුතුය.

17. ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

17.1. ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට යම යෝජනාවක් ඕනෑම මධ්‍යම කාරක සභිකයෙකුට ඉදිරිපත් කළ හැක.

17.2. ව්‍යවස්ථා සංශෝධන යෝජනාව මධ්‍යම කාරක සභා රැස්වීමේ දිනට දින 7කට පෙර මධ්‍යම කාරක සභාවේ සෑම සාමාජිකයෙකුටම ඉදිරිපත් කළ යුතුය.

17.3. මධ්‍යම කාරක සභාව විසින් විශේෂ බහුතරයෙන් එකී ව්‍යවස්ථා සංශෝධනය අනුමත කලේ නම් එකී ව්‍යවස්ථා සංශෝධනය ව්‍යවස්ථාවේ කොටසක් බවට පත් වේ.

17.4. එකී ව්‍යවස්ථා සංශෝධනය මධ්‍යම කාරක සභාව අනුමත කලේ නම් මී ළඟ පක්ෂ සම්මේලනයේ දී එය අනුමත කර ගත යුතුය.

17.5. පක්ෂ සම්මේලනයේ දී එකී ව්‍යවස්ථා සංශෝධනය අනුමත නොවුණොත් එදින සිට එය ව්‍යවස්ථාවේ කොටසක් ලෙස නොසැලකේ.

17.6. යම් ව්‍යවස්ථා සංශෝධනයක් මධ්‍යම කාරක සභාව විසින් අනුමත කර පක්ෂ සම්මේලනය විසින් ප්‍රතික්ෂේප කළොත් එකී ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක වී තිබුණු කාල වකවානුවේ දී එකී සංශෝධිත වගන්ති යටතේ ගත් තීන්දු වල නීත්‍යානුකූලත්වයට එයින් කිසිම බලපෑමක් ඇති නොවන්නේය.

පළමු උපලේඛනය

